# 2018.10.11 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

**<u>පැමිණීම</u>**

01.ගරු සභාපති කේ.වී. සුසන්ත පෙරේරා මහතා
02.ගරු උප සභාපති ආර්.ඒ. නිලංක සඳකැල් මහතා
03.ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා
04.ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
05.ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
06.ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතා
07.ගරු මන්ත්‍රිනි ආර්. නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
08.ගරු මන්ත්‍රී කේ .නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
09.ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
10.ගරු මන්ත්‍රී එල්.කේ .ජගත් ප්‍රියංකර මහතා
11.ගරු මන්ත්‍රී ඩබ්. ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා
12.ගරු මන්ත්‍රී ඒ. රෙක්සි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13.ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා
14.ගරු මන්ත්‍රිනි ජී. ලීනා ප්‍රියන්ගිකා පෙරේරා මහත්මිය
15.ගරු මන්ත්‍රිනි ජේ.කේ. දීපා මේරි අයිරංගනි පෙරේරා මහත්මිය
16.ගරු මන්ත්‍රී කේ. නොඑල් සුදත් ජානක පෙරේරා මහතා
17.ගරු මන්ත්‍රී එල්. දිනේෂ් චන්දන පෙරේරා මහතා
18.ගරු මන්ත්‍රී ඩබ්.ඒ. රෙන්ප්‍රිඩ් ෂවින් ප්‍රනාන්දු මහතා
19.ගරු මන්ත්‍රී ආර්.පී. අකිල ශිරංග රාජපක්ෂ මහතා
20.ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මයා
21.ගරු මන්ත්‍රී ඩබ්. ස්ටැන්ලි තිසේරා මයා
22.ගරු මන්ත්‍රී ජී.කේ. අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
23.ගරු මන්ත්‍රී එච්.ඒ. සී.පෝල් පෙරේරා මහතා
24.ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා
25.ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා
26.ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා
27.ගරු මන්ත්‍රී ඩී. නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා
28.ගරු මන්ත්‍රී බී. ඇන්ටනි සුනිල් ශාන්ත පෙරේරා මහතා
29.ගරු මන්ත්‍රී ඩබ්. සුරේන් ඇන්ටන් ශ්‍රිනාත් ප්‍රනාන්දු මහතා
30.ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය

31.ගරු මන්ත්‍රිනි පි.එම්. ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය

32.ගරු මන්ත්‍රිනි ආර්.පි. නදීකා රණවිර මහත්මිය

33.ගරු මන්ත්‍රී වි.ඒ. වර්ණරංග ගුණසේකර මහතා

34.ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා

35.ගරු මන්ත්‍රිනි ඒ.එම්. චමිලා දිල්රුක්ෂිකා මහත්මිය

36.ගරු මන්ත්‍රී එම්.පි.ඩි. උදේෂ් තරංග කරුණාරත්න මහතා

37.ගරු මන්ත්‍රී ටි.බි.ඩි. ඇන්ටනි කුමාර් මහතා

38.ගරු මන්ත්‍රී වි.කේ.එම්. අසන්ත කුලසේකර මහතා

39.ගරු මන්ත්‍රී එච්. විමල් රෝහිත සුසන්ත පෙරේරා මහතා

40.ගරු මන්ත්‍රී එස්.එම්. දර්ශන දිමුතු කුමාර සුබසිංහ මහතා

මෙදින පෙ.ව 10.00 ට මහ සභා රැස්විමේ කටයුතු ගරු සභාපති කේ.වි. සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා රැස්විම් ශාලාවේ දී ආරම්භ විය.

ගරු උපසභාපතිතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රිවරුන් හා මන්ත්‍රිවරියන් ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදි.

**01. 2018.09.13 දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම**

- විශේෂ නිවේදන අංක vi යටතේ 2018.10.05 වන සිකුරාදා දින උදෑසන 8.30 සිට සවස 3.00 දක්වා යෝගියාන ජයසුන්දරාරාම විහාරස්ථාන භූමියේ දී **ජංගම සේවාව** පැවැත්වීමට කටයුතු යොදා ඇත යනුවෙන් නිවැරදි විය යුතු බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදි.

- විශේෂ නිවේදන අංක xix යටතේ **2016** පාර්ලිමේන්තු ගිණුම්කාරක සභාවේ ඇගයීමට ලක් වූ දිවයිනේ පළමු රාජ්‍ය ආයතන අතරට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවද ඇතුලත් වී ඇගයීමට ලක් වී ඇත. ඒ සඳහා කැපවීමෙන් කටයුතු කල සියලුම දෙනා වෙත ස්තුතිය පුද කර සිටිමි යනුවෙන් නිවැරදි විය යුතු බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදි.

- වෙනත් කරුණු යටතේ 14 පිටුවේ 02 ඡේදයේ සඳහන් බොරලැස්ස කොස්ගහවත්ත ජනපදයේ මාර්ග සංවර්ධනය පිළිබඳ ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා කළ ප්‍රකාශය.

  "බොරලැස්ස කොස්ගහවත්ත ජනපදයේ පන්සල ඉදිරිපිට මාර්ගය ගිංඔය රක්ෂිතයට අයත් මාර්ගයකි. ඒ සඳහා අවසර ලබාගෙන ඇත්ද? නැත්ද? යන්න මා නොදන්නා අතර, ගමේ ජනතාව ඒ පිළිබඳව විරෝධයක් පළ නොකරන බැවින්, පොහොට්ටුවෙන් හෝ අලියාගෙන් හෝ නිරෝෂා මන්ත්‍රිතුමියගෙන් හෝ ප්‍රියාල් මහබඳුගෙන් හෝ සුසන්ත ගරු සභාපතිතුමාගෙන් හෝ සේවය විය යුතුය. මම ඒ ගැන කථා කරන්න ගියේ නැහැ. ඔබතුමාලා අවසර අරගෙන තියනවාද නැද්ද කියලා. ඒක රිසවේෂන් එකට අයිති පාරක් ඒ වැඩේ වෙන්න ඕනා. ඒ ගමේ ජනතාව ඉන්නවා හැබැයි ඒ උස් බිමක පවතින සෝද පාලුව කියන දේට නුවරඑළියේ තාර දාන්නේ, කොන්ක්‍රිට් ගහනනේ නැහැ. එහෙත් පාර ඔරොත්තු දෙනවා. නුවරඑළියේ කොන්ක්‍රිට් පාරවල් අඩුයි. හැබැයි බොරලැස්ස කොස්ගහවත්ත ජනපදයේ පන්සල ඉදිරිපිට පාර කොන්ක්‍රිට් කරලා. මම මේ ගරු සභාවේ ගරු සභාපති ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට ඒ යෝජනාව මම දැන ගැනිම සඳහායි කිව්වේ. මෙය සභා අරමුදල් අපතේ යාමක් ගරු ශිරෝන් මන්ත්‍රී තුමා විපක්ෂය වෙනුවෙන් කර්මාන්ත කමිටුව නියෝජනය කර දැනුවත් කරයි."

  යන ලෙස කළ ප්‍රකාශය සම්පූර්ණයෙන් ඇතුලත් කරන ලෙස ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා ඉල්ලා සිටින ලදි.

ඉහත සංශෝධන සහිතව 2018.09.13 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතාගේ හා ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන**

i. ජාත්‍යන්තර සුදු සැරයටි දිනය සැමරුම් වැඩසටහනට සමගාමීව 2018.10.18 දින පෙ.ව.10.00 වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අසලින් දෘශ්‍යාබාධිත සම්මේලනයේ සාමාජිකයන්ගේ පෙරහැර ආරම්භ වේ. ඉන්පසුව පෙ.ව.10.30 ට මෙම සභාවේ ශ්‍රවණාගාරයේදී සැමරුම් උත්සවය ආරම්භ වේ. එහිදි දෘශ්‍යාබාධිත පුද්ගලයින් 40 දෙනකු සඳහා උපකරණ ප්‍රදානය සිදු වේ. එම අවස්ථාවට සභාවේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලාට ආරාධනා කරමි. මෙම වැඩ සටහන සඳහා වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හා වෙන්නප්පුව පොලිසියේ අනුග්‍රහය ද ලැබී ඇත.

ii. පසුගිය සභාවේදී නිවේදනය කළ පරිදි 2018.10.05 දින යෝගියාන ජයසුන්දරාරාම විහාරස්ථානයේදී අදාල ජංගම සේවාව සාර්ථකව පවත්වන ලදි. ඒ සඳහා සහයෝගය ලබා දුන් ජයසුන්දරාරාම විහාරධිපති ගරු පූජ්‍ය සෝභිත ස්වාමින්වහන්සේ වෙත විශේෂ ස්තූතිය පුදකර සිටින අතර, එම කටයුතු සඳහා සහයෝගය ලබා දුන් ගරු මන්ත්‍රී එල්.කේ. ජගත් ප්‍රියංකර මහතා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන් වෙතත් ස්තූතිය පුදකරමි. තවද එම ජංගම සේවය සාර්ථක කර ගැනිමට සහයෝගය ලබා දුන් දන්කොටුව රෝහලේ වෛද්‍ය අධිකාරිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලයටත්, දන්කොටුව විද්‍යාතා මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලයටත්, දන්කොටුව පොලිස් ස්ථානයේ කාර්ය මණ්ඩලයටත්, වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයේ සියලුම දෙනා වෙතත් ස්තූතිය පුදකර සිටිමි. මෙම වැඩසටහනෙහි අත්දැකීම් උපයෝගී කර ගනිමින් ඉදිරියේදී තවත් ජංගම සේවා පැවැත්විමට ගරු මන්ත්‍රී මණ්ඩලයේ අදහස් හා යෝජනා අපේක්ෂා කරමි.

iii. පළාත් පාලන සේවා තරඟ විනිශ්චය සඳහා විනිශ්චය මණ්ඩලය 2018.09.27 හා 28 දෙදින අදාල කාර්ය ස්ථානවලට පැමිණෙන ලදි. එම කටයුතු සඳහා අදාල කාර්ය ස්ථාන සූදානම් කිරිමට කැපවීමකින් කටයුතු කල ගරු උපසභාපති ආර්.ඒ. නිලංක සඳකැල් මහතා හා ප්‍රජා සංවර්ධන කාරක සභා ගරු සභාපති ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා හා පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභා සභාපති යූ. ජුඩ් එම්මානුවෙල් මහතා හා පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා සභාපති ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා හා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්, මන්ත්‍රීතුමියන් වෙත හා කාර්ය මණ්ඩලය සියලුම දෙනා වෙත ස්තූතිය පුද කර සිටිමි. එම තරගය සඳහා ඉදිරිපත් කර ඇති කාර්ය ස්ථාන 12 න් සැලකිය යුතු ප්‍රමාණයකට ජයග්‍රහණය හිමි වෙතැයි බලාපොරොත්තු වෙමි.

iv. බල ප්‍රදේශයේ අලුතින් මාර්ග ඉදිකිරිමට අදාල වැඩ විෂයන් 62 ක ඉදිකිරිම් මේ වන විට නිම වී ඇත. වැඩ විෂයන් 22 ක වැඩ නිම කිරිමට ඉතිරිව ඇත. ගොඩනැගිලි ඉදිකිරිම හා ප්‍රතිසංස්කරණය කිරිමට අදාලව ඇස්තමේන්තු 37 ක් අනුමත කර ඇත. එයින් මේ වන විට වැඩ විෂයන් 20 ක් නිමකර ඇත. ඉතිරි වැඩ විෂයන්වල කටයුතු මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවති.

සභාවේ වැඩ ඒකකය මගින් අබලන් වූ මාර්ග ප්‍රතිසංස්කරණය කිරිම හා මාර්ග දෙපස කැලය කැපිම් කිරිමේ කටයුතු සියලුම මන්ත්‍රී කොට්ඨාස ආවරණය වන පරිදි ක්‍රියාත්මක වෙමින් පවති.

බල ප්‍රදේශයේ විදී පහන් නඩත්තු කටයුතු පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභා සභාපතිතුමාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වෙමින් පවති. දිවා කාලයේ දැල්වෙන විදී පහන් සම්බන්ධව අවධානය යොමු කලයුතු බව නැවතත් මතක් කරමි.

මන්ත්‍රී කොට්ඨාශ තුළ පිහිටි සභාව සතු ඉඩම ආරක්ෂා කරගැනිමට අදාල යෝජනා හා මාර්ග නම් කිරිමට අදාල යෝජනා මේ දක්වා ලබා දී නොමැති මන්ත්‍රීතුමන්,මන්ත්‍රීතුමියන් ඒවා කඩිනමින් ලබා දිය යුතු බව දන්වමි.

බල ප්‍රදේශයේ කසල කළමනාකරණ කටයුතු වැඩිදියුණු කිරිමට ආධාර ලබා ගැනිමේ අරමුණින් මා විසින් සිදුකල විදේශ සංචාරයේදී ඉතාලියේ වෙරෝනා නගරයේ නගරාධිපතිතුමා සමඟ සාකච්ඡා කිරිමට හැකි විය. එම සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස කසල ප්‍රවාහනය සඳහා අවශ්‍ය ට්‍රක් රථයක් හා නගරවල තැබිමට අවශ්‍ය කසල බඳුන් සහන මිලට ලබා ගැනිමට එකඟතාවය එල කර ඇත. එම කටයුත පිළිබඳ තවදුරටත් අත්දැකීම් ලබා ගැනිම සඳහා කාරක සභා සභාපතිවරුන්ට හා නිලධාරි මණ්ඩලයේ කිහිපදෙනෙකු යොමු කිරිමටද එහි එකඟතාවය ලැබී ඇත.

2019 අයවැය ලේඛනය, 2019-2022 සිව් අවුරුදු සැලැස්ම සකස් කිරිම සඳහා මේ දක්වා සේවාව ලබා යෝජනා ලබානොදුන් මන්ත්‍රි මණ්ඩලය එම යෝජනා 2018.10.15 දිනට ප්‍රථම ලබා දෙන ලෙසද දන්වමි.

2018.10.05 දින පැවති අන්තර් පළාත් පාලන වොලිබෝල් තරගාවලිය සඳහා වෙන්නප්පුව ප්‍රා දේශිය සභාව වෙනුවෙන් සහභාගි වු කාන්තා හා පිරිමි කණ්ඩායම්වල සියලුම සාමාජිකයන් වෙත හා එම කටයුතු සඳහා කැපවීමෙන් කටයුතු කල වෙන්නප්පුව ඇල්බට් ඇෆ් පිරිස් ක්‍රිඩාංගනයේ, ක්‍රිඩාංගන භාරකරු තරංග කොස්තා මහතා සහ රසිංක පෙරේරා මහතා වෙතත් කණ්ඩායම පුහුණු කිරිම සඳහා දායකත්වය ලබාදුන් ක්‍රිසිලා ඇග්නස් මහත්මිය වෙතත්, ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය ඇතුළු කාර්ය මණ්ඩලය වෙතත් ස්තුතිය පුදකරමි.

v. හදිසි රියඅනතුරකට ලක්වු නිසා අද දින මහ සභා රැස්විම සඳහා සහභාගි විමට නොහැකි බව ගරු මන්ත්‍රිනි ඩබ්. දුලක්ෂි වමෝදරි ප්‍රනාන්දු මෙනවිය විසින් දන්වා එවා ඇත. 2018.10.11 දිනට නිවාඩු අනුමත කරමි.

vii නොලැක්විය හැකි හේතුවක් නිසා අද දින මහ සභා රැස්විම සඳහා සහභාගි විමට නොහැකි බව ගරු මන්ත්‍රිනි එම්. එම්. මේරි වාලට් කුරේ මහත්මිය විසින් දන්වා එවා ඇත. 2018.10.11 දිනට නිවාඩු අනුමත කරමි.

viii. අද දින මහ සභා රැස්විම සඳහා සහභාගි විමට නොහැකි බව ගරු මන්ත්‍රි සී.පී. සරත් වික්‍රමරත්න මහතා දන්වා එවා ඇත. 2018.10.11 දිනට නිවාඩු අනුමත කරමි.

ix. අද දින මහ සභා රැස්විම සඳහා සහභාගි විමට නොහැකි බව ගරු මන්ත්‍රිනි අයි. නයෝමි රම්‍යලතා මහත්මිය දන්වා එවා ඇත. 2018.10.11 දිනට නිවාඩු අනුමත කරමි.

**03. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

i. උ/ගෝනවිල ග්‍රාම සේවා වසමේ දැනට කොටස් කර අලෙවිකරනු ලබන ඉඩම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රි එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා ඉදිරිපත් කරන ලද ප්‍රශ්ණය

"උ/ගෝනවිල ග්‍රාම සේවා වසමේ දැනට කොටස් කර අලෙවිකරනු ලබන ඉඩම හෙට්ටිආරච්චි වෙළදාම් දේපල සමාගම විසින් මිලදී ගැනිමේදී ඔප්පු අංක 4681 සහ ඔප්පු අංක 4680 දරණ ඔප්පු එම ප්‍ර දේශයේ ඉඩම් වල වටිනාකම අනුව බලනවිට එම ඉඩම් වටිනාකම අඩු මිළ ගණන් යොදා ඔප්පු ලියා තිබෙන බැවින් රජයට (ප්‍රාදේශිය සභාවට) යම් මුදලක් ලැබිය යුතුද ලබා ගත හැකිද යන්න ගැන පරික්ෂණයක් කරන මෙන් යෝජනා කරමි. සභාවේ මන්ත්‍රිවරුන්ගේ දැනගැනිම පිණිස පිටපත් 02ක් සභා ගත කරන මෙන් ඉල්ලා සිටිමි. එම ඔප්පු ලියන ලද්දේ කුමන නොතාරිස් තැන විසින්ද? මෙම ඉඩමෙන් සභාවට ලැබිය ඇති මුදල කොපමණද?" යනුවෙන් ගරු මන්ත්‍රි එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා විසින් ප්‍රශ්ණය ඉදිරිපත් කරන ලදි.

ගරු සභාපතිතුමාගේ පිළිතුර

01. උ/ගෝනවිල ග්‍රාම නිලධාරි වසමේ හෙට්ටිආරච්චි ලෑන්ඩ් සේල් ආයතනය විසින් කට්ටිකර විකුණු ලබන ඉඩමට අදාල 4680,4681 අංක දරණ ඔප්පු සභාවට ඉදිරිපත් කරමි.

02. එම ඔප්පු 02 සහතික කර ඇත්තේ වෙන්නප්පුව ජෝශප් වාස් විද්‍යාලය ඉදිරිපිට යන ලිපිනයෙනි කාර්යාලය පවත්වා ගෙන යන ශ්‍රේෂ්ඨාධිකරණ නිතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ආර්.එන්.ජේ. ප්‍රනාන්දු මහත්මිය විසිනි.

03. මෙම ඉඩම් විකිණිමට අදාලව සභාවට ලැබී ඇති 1% බදු මුදල පහත සඳහන් පරිදි වේ.

| ලදුපත් අංක | දිනය | අය වී ඇති මුදල රු. |
|---|---|---|
| 77349 | 2017.11.22 | 632500.00 |
| 77348 | 2017.11.22 | 228500.00 |
| | | 861000.00 |

04. එම ඉඩම විකිණිමට අදාල ඔප්පු සඳහා අඩු මිලක් යොදා ඔප්පු ලියා තිබේනම් ඒ පිලිබදව වයඹ පළාත් ආදායම් කොමසාරිස් විසින් අවශ්‍ය පියවර ගනු ඇත.

ii. PF-7444 අංක දරණ ගරු සභාපති තුමාගේ නිල රථයේ ධාවන සටහන් සම්බන්ධයෙන් හා රියදුරු ගෙවීම් සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා ඉදිරිපත් කරන ලද ප්‍රශ්ණය

ගරු සභාපතිතුමා විසින් භාවිතා කරනු ලබන PF-7444 අංක දරණ නිල රථයේ ධාවන සටහන් සම්බන්ධ සහ ඉන්ධන ලබාගැනිමේදී අනුගමනය කර තිබෙන ක්‍රම වේදය රියදුරු මහතා විසින් ලබාගෙන ඇති OT /බටා මුදල ලබා ගැනිමේදී ඇති වී තිබෙන අක්‍රමිකතාවය පිළිබද පරික්ෂණ කටයුත්ත සහ ගරු සභාවේ මන්ත්‍රිවරුන්ගේ දැන ගැනිම පිණිස එම වාර්තා පිටපත් සභාගත කරන ලෙස යෝජනා කරමි. ධාවන සටහන් නිසි බලධාරියා වෙත යොමු නොකොට අතිකාල ලබා ගත්තේ කෙසේද? , ඉන්ධන ලබා ගැනිමේදී මයිලෝ මීටරය සඳහන් කර නොතිබෙන්නේ මන්ද? මාසයක් පසා ලබාදිය යුතු ධාවන සටහන් ලබා නොදෙන්නේ කුමන හේතුවක් නිසාද?''යනුවෙන් ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා විසින් ප්‍රශ්ණය ඉදිරිපත් කරන ලදි.

ගරු සභාපතිතුමාගේ පිළිතුර

01. PF-7444 කැබ් රථයට අදාල ධාවන සටහන් 2018 සැප්තැම්බර් මස දක්වා කාර්යාලයට භාර දී ඇත.

02. 2018 අගෝස්තු මාසය දක්වා අතිකාල දිමනා ගමන් වියදම් රියදුරු විසින් ලබා ගෙන ඇත. ඒවා ඉදිරිපත් කර ඇති ධාවන සටහන් සමඟ නිවැරදි බවට සහතික කර ඇත.

03. ඉන්ධන ලබා ගැනිමේද මයිලෝ මීටරයේ සටහන් කිරිමට රියදුරු වෙත උපදෙස් ලබා දි ඇත. ලබාගෙන ඇති ඉන්ධන ධාවන සටහනට ඇතුලත් කර ඇත.

04. මෙම කරුණු පිළිබඳව මන්ත්‍රීතුමා විසින් වයඹ පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල පිළිබඳව කරුණු පරික්ෂා කිරිම සඳහා විමර්ෂණ නිලධාරි මහතා 2018.10.09 දින මෙම කාර්යාලයට පැමිණ ඇත. එම පරික්ෂණ වාර්තාව ලැබුණු පසුව මේ පිළිබඳ තොරතුරු මහ සභාවට ඉදිරිපත් කරමි.

**04. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපතිතුමාගේ යෝජනා**

**I.** 2018 සැප්තැම්බර් මස 30 දිනට ජංගම ගිණුමේ රු. මිලියන 100 ක ශේෂයක් පවතින බැවින් රු. මිලියන 30 ක් මාස 03 ක කාලයක් සඳහාත්, මිලියන 30 ක් මාසයක කාලයක් සඳහාත් ස්ථාවර තැන්පතු ගිණුම්වල ආයෝජනය කිරිම සඳහා අනුමැතිය ලබා ගැනීම පිළිබඳ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

2018 සැප්තැම්බර් මස 30 දිනට ජංගම ගිණුමේ රු. මිලියන 100 ක ශේෂයක් පවතින බැවින් රු. මිලියන 30 ක් මාස 03 ක කාලයක් සඳහා 11 % ක වැඩිම පොළී ප්‍රතිශතයක් ඉදිරිපත් කර ඇති කිරිමැටියාන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ හා මිලියන 30 ක් මාසයක කාලයක් සඳහා 7.20% ක වැඩිම පොළී ප්‍රතිශතයක් ඉදිරිපත් කර ඇති කිරිමැටියාන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ස්ථාවර තැන්පතු ගිණුම්වල ආයෝජනය කිරිම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කිරිමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**II.** 2018 වර්ෂයේ 04 වන පරිපූරක ඇස්තමේන්තුව අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

2018 වර්ෂයේ 04 වන පරිපූරක ඇස්තමේන්තුව අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කිරිමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**III.** ක්‍රිඩා සංවර්ධන හා ප්‍රජා සංවිධාන ශක්තිමත් කිරිමේ කාරක සභාව වෙත ක්‍රිඩා ආධාර අනුමත කිරීම සඳහා බලතල පැවරිම.

ක්‍රිඩා සංවර්ධන හා ප්‍රජා සංවිධාන ශක්තිමත් කිරිමේ කාරක සභාව වෙත ක්‍රිඩා ආධාර අනුමත කිරීම සඳහා බලතල පැවරිමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කිරිමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**iv.** ගිංඔය ආසන්නයේ සිදුකරන ඉදිකිරිම් ඇතුළු සංවර්ධන කාර්යයන් සඳහා සුදුසු නියමයන් හා නිර්දේශය ලබා දිමට ඊට අදාල විවිධ රාජ්‍ය ආයතනවල නිලධාරින්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරිම හා ඊට අදාල ගාස්තු අයකර ගැනිම පිළිබඳ තීරණය කිරිමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ස්ථිර කරන ලදි.

පරිසර හා මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා සභාපති ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා කථා කරමින්, ගිං ඔය සම්බන්ධ ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය

සභාවේ පරිසර නිලධාරි, මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂතුමා, පළාත් පරිසර අධිකාරියේ අධ්‍යක්ෂතුමා, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ධීවර අමාත්‍යාංශය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ඇතුළු ආයතන 10 ක් සමඟ සම්බන්ධ වී කමිටුවක් ලෙස සාකච්ඡා කළ බව ප්‍රකාශ කරන ලදි.

එහිදි විශේෂ ගැටළුවක් වුයේ, ගිංඔය ආශ්‍රිතව යම් යම් අය ගිංඔය කඩොලාන හා ගිංපොල් විනාශ කරමින්, ගිංඔය රක්ෂිතය දක්වාම අයිතිය තහවුරු කරමින් පවතින බැවින්, ගිංඔය රක්ෂිතයක් අහිමි වෙමින් පවතින බවත්ය. මේ සම්බන්ධව කවුරුන් හෝ ඉදිකිරිමක් හෝ සංවර්ධනය කිරිමක් කරන විටදී ඉහත ආයතන සියල්ල  සම්බන්ධිකරණය කර ගනිමින් අදාල අනුමැතිය හා නිර්දේශයන් ලබා දිමට එම සාකච්ඡාවේදී ප්‍රාදේශීය සභාවට බලය පැවරුණ අතර. එහිදි මතු වු කරුණු අතරින් අදාල ආයතන මගින් මීට පෙර සිදුකර තිබුනේ ගිංඔයට මායිම්ව තිබු ඉඩම්වල හිමිකරුවන් ඉඩම් මැණුම් කටයුතු කිරිමේදී ගිංඔය මායිම් දක්වාම තම ඉඩමට ඇතුළත් කර මැණුම් වාර්තා සකස් කරන බවත් ඒවා අදාල ආයතනවලට ඉදිරිපත් කිරිමේදී  එම ආයතනවලින් අනුමැතිය ලබා දීමට කටයුතු කිරිම ගැටළු සහගත බවට හදුනාගත් බවත් පැහැදිලි කරන ලදි. එමගින් අදහස් කරන්නේ කුමක්ද යන්න ගරු සභාපතිතුමාගේ විමසුමට අනුව ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා පිළිතුරු දෙමින් මෙවැනි ක්‍රියා මගින් ගිංඔය රක්ෂිතයක් නොමැති වීමත් ගිංඔය සීමාව තෙක් ඉඩම් හිමියා පරිහරණය කිරිමත්, බොහෝ ආයතන ක්ෂේත්‍ර පරික්ෂාවක් සිදුනොකර ඉඩමේ මිණුම්දෝරු සැලැස්ම පමණක් සළකා නිර්දේශ හා අනුමැතිය ලබා දිම මේවන තෙක් පැවති ක්‍රමය බවත්  පැහැදිලි කරන ලදි.

ගාස්තු අයකිරිමක් ලෙස අදහස් කරන්නේ ගිංඔය ආශ්‍රිතව යම් සංවර්ධන කටයුත්තක් හෝ ඉදිකිරිම් කටයුත්තක් සිදුවන විට ප්‍රාදේශීය සභාවේ අධික්ෂණය හරහා සියලු ආයතන සම්බන්ධිකරණය කරගෙන ඒ ආයතනවල නිර්දේශ ලබා දිමට කටයුතු කරනවිට  අදාල ආයතන මගින් ක්ෂේත්‍ර පරික්ෂාව සිදු කිරිමේදී නිලධාරින් වෙත ගමන් ගාස්තු ගෙවිම සඳහා ඉල්ලුම් කරුවන්ගෙන් ගාස්තුවක් අයකර ගැනිමට කටයුතු කිරිම බව පැහැදිලි කරන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින් මේ සම්බන්ධව තවදුරටත් පැහැදිලි කරමින්, ආයතන සියල්ල ඒකාරාශි වී ප්‍රාදේශීය සභාව හරහා ඒකාබද්ධ පරික්ෂණයක් කැඳවා අදාල ක්ෂේත්‍රය පරික්ෂා කර අදාල නිර්දේශ හා අනුමැතිය  ලබාදිම මෙමගින් සිදුවන බව ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී එම්.පි.ඩි. උදේෂ් තරංග කරුණාරත්න මහතා කථා කරමින්, පරිසර කමිටුවේ මේ පිළිබඳව සාකච්ඡා කළ බවත්, දැනට ගිංඔය රක්ෂිතය ලෙස කොපමණ ප්‍රදේශයක් සළකා බලන්නේ ද යන්න ගැටලු සහගත බවත් දැනට ගිංඔය ආශ්‍රිතව පදිංචි වි සිටින අයෙක් අලුතින් ඉදිකිරිමක් කරන විට මෙම තීරණ බලපාන  ආකාරය කෙසේද යන්නත් ප්‍රශ්න කරන ලදි.

මෙය බලපාන්නේ වෙරළේ සිට කිලෝමිටර් 02 ක් දුරට බව ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා පැහැදිලි කරන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණි අසෝක ප්‍රනාන්දු මහතා කථා කරමින්, පරිසර කටයුතු සම්බන්ධයෙන් අවසර ගත යුතු වැඩිම ආයතන සංඛ්‍යාවන් ඇත්තේ ලංකාවේ බවත්,  එබැවින් තවත් ආයතන ස්ථාපිත කිරිම වේගයෙන් යෙන් සංවර්ධනය වෙමින් පවතින වෙන්නප්පුව වැනි ප්‍රෙද්ශයකට අවශ්‍ය නොවන බවත්, ප්‍රාදේශිය සභාවේ පරිසර නිලධාරි හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය නිලධාරින්, වෙරළ සංරක්ෂක නිලධාරින් සිටින බැවින්  තවදුරටත් කණ්ඩායමක් වශයෙන් නිර්දේශ ලබාගැනිමට යොමු කර ජනතාව පීඩාවට ලක්නොකළ යුතු බවත් අදාල නිලධාරින් ස්ථාපිත කර තිබියදී මෙවැනි කමිටුවක අවශ්‍යතාවයක් නොදකින බවටත් අදහස් ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා කථා කරමින්, ගිංඔය ප්‍රෙද්ශය ගැසට් කිරීමට සූදානම් කර ඇති බැවින්, එතෙක් කමිටුවක් පත් කිරීමේ අවශ්‍යතාවය පවතින බව ප්‍රකාශ කරන ලදි.

ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සෘජුවම ප්‍රදේශයේ නළ ලිං සඳහා අවසර ලබාදීම නතර කිරීමට අදාලව සභාවේ මැදිහත් වීමක් ඇතිව ක්‍රියාමාර්ග ගැනීම කළ යුතු බවට ගරු සභාපතිතුමා සභාව දැනුවත් කරන ලදි.

ගරු මන්ත්‍රිනි ආර්. නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය කථා කරමින්, පසුගිය පරිසර හා මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා සාමාජිකයින් හා නිලධාරීන් හා ප්‍රා දේශීය ලේකම් කාර්යාල නිලධාරීන් කියා සිටියේ ගිං ඔය රක්ෂිතයේ භූමි ප්‍රමාණය කොපමණ ද යන්න සීමාවන් පිළිබඳ ගැසට් කර නොමැති බවත්, ගගේ පතුලේ ප්‍රමාණය සිට රක්ෂිතය කොපමණ දුරකට දීර්ඝ විය යුතු ද ? යන්න තීරණයක් ගෙන ඇති බව එක් කාරණාවක් බවත් අනික් කාරණය ඉඩම් හිමියා විසින් මායිම් සකස් කරන බැවින් සමහර අවස්ථාවල ගිං ඔය මායිම් දක්වා සැලසුම් පත් සකස් කර ඇති අතර, එම සැලැසුම්පත් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට අදාල ආයතනවලට රැගෙන යාමේදී නිලධාරීන් විසින් මීට පෙර දෙන ලද නිර්දේශයන් හා වාර්තා සළකා බලා අවසර ලබාදීම සිදු කරන බවත් නැවත ස්ථාන පරික්ෂණයක් සිදු කිරීමකින් තොරව එක් ආයතනයක් මගින් ලබා දෙන නිර්දේශ මත සියලු ආයතන අදාල නිර්දේශ ලබාදීම සාමාන්‍ය සිදුවන ක්‍රියාපරිපාටිය බව පැහැදිලි කරන ලදි. එම ආයතන වල නිලධාරීන් විසින් ගමන් වියදම් දරා වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පැමිණීම අපහසු නිසා ප්‍රාදේශීය සභාවෙන් අයදුම්පතක් ලැබුණු විට ප්‍රාදේශීය සභාවේ නිලධාරී මගින් නිර්දේශ ලබාදීමට කටයුතු කරන ලෙසට ඉල්ලීමක් කළ බවත් පැහැදිලි කරන ලදි.

ගරු සභාපතිතුමා කථා කරමින්, එම කාර්යය හා පරිසර හා මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභාව මගින් ක්‍රියාත්මක කරන ලෙසට දන්වා සිටින ලදි. ඒ අනුව ඉහත යෝජනාව සම්මත වීමක් හෝ ප්‍රතික්ෂේප වීමක් සිදුනොවුණි.

**v.** නැ/කිරිමැටියාන සුසාන භූමිය පාරේ සිට ප්‍රධාන මාර්ගය වෙත කියුබ් 03 ටිපර් රථ මගින් කැකුණගහ වැවෙන් ඉවත් කරන පස් ප්‍රවාහනය කිරීම සඳහා නැ/කිරිමැටියාන ගොවි සංවිධානය වෙත අවසර ලබාදීම පිළිබඳව තීරණයක් ගැනීමට අදාළ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා කථා කරමින්, ගොවි සංවිධාන මගින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපියේ ගොවි සංවිධානයේ ලියාපදිංචි අංකයක් නොමැති බවත්, ලියාපදිංචි අංකය සඳහා හිස්තැනක් සහිතව නිල මුද්‍රාව තබා අත්සන් කර ඇති බවත් පැහැදිලි කරන ලදි. ගොවි සංවිධානයේ ලියාපදිංචි සහතිකය සහ මාර්ග සංවර්ධනය කිරීම සඳහා අවශ්‍යවන රු.ලක්ෂ 04 ක මුදල ප්‍රාදේශීය සභාව වෙත තැන්පත් කිරීමෙන් අනතුරුව අවසර ලබාදීම සිදුකළ යුතු බව ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා අදාල කොට්ඨාසයේ මන්ත්‍රීවරයා ලෙස කරුණු පැහැදිලි කරන ලදි. ගොවි සංවිධානය මගින් එතුමාගෙන් ඉල්ලීමක් කළ බවත්, ප්‍රාදේශිය සභා ගරු සභාපතිතුමා විදේශගතව සිටි බැවින්, එම ඉල්ලීම ගරු උපසභාපතිතුමා වෙත යොමු කළ බවත්, ගරු මන්ත්‍රී සි.පි. සරත් වික්‍රමරත්න මහතා සමගද සාකච්ඡා කරන ලද බවත් ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී එල්.කේ .ජගත් ප්‍රියංකර මහතා කථා කරමින්, මේ සම්බන්ධව ප්‍රදේශයේ යම් විරෝධතාවයක්, ගැටළුවක් නොවී අයථා දෙයක් සිදුනොවන්නේ නම් මෙම රුපියල් ලක්ෂ 04 ක මුදලින් මාර්ගය සකස් කර ගැනිමට හැකි බැවින් ඊට අදාල අවසර ලබා දීමේ ලිපිය ලබාදෙන ලෙසත් මේ ක්‍රියාව දිගටම සිදුකර ගැනිම සඳහා මෙම ලිපිය භාවිතා කිරිම සිදුකළ හැකි බැවින් වැව සකස් කළ යුතුද, වැවේ පස් ප්‍රවාහනය කළ යුතුද, පස් රැගෙන යන්නේ කුමන ස්ථානයකටද, එක් පුද්ගලයකුගේ වුවමනාවකට ගොවි සංවිධානයේ නම භාවිතා කළ මෙවැනි ක්‍රියා සිදුකරන්නේද යන්න සොයා බැලිය යුතු බවත්, පැහැදිලි කරන ලදි.

ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා කථා කරමින්, වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යතුමාගේ ප්‍රතිපාදන යටතේ මෙම ව්‍යාපෘතිය සිදුවන බවත් සභාව මේ සඳහා සහයෝගය ලබානොදෙන බවට චෝදනාවක් පවතින බවත්, අයථා වැඩවලට සහයෝගය ලබානොදෙන අතර, වැව සකස් කිරිම පොදු කටයුත්තක් බැවින්, මෙවැනි කටයුත්ත සඳහා සභාවේ සහයෝගය ලබාදෙන බව ප්‍රකාශ කරන ලදි.

ලියාපදිංචි අංකය ඉදිරිපත් කිරිමෙන් පසුව නැ/කිරිමැටියාන ගොවි සංවිධානය වෙත කැකුණ ගහ වැවෙන් පස් ප්‍රවාහනය කිරිම සඳහා අවසරය ලබාදිමට අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**vi.** සී/ස වෙන්නප්පුව විවිධ සේවා සමුපකාර සමිතිය මගින් නයිනමඩම කෝප් සිටි වෙළඳසැල පුළුල් කිරිමට අදාලව ඉදිරිපත් කර ඇති ඉල්ලිමට අදාළ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු උප සභාපති ආර්.ඒ. නිලංක සඳකැල් මහතා ස්ථිර කරන ලදි.

ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා කථා කරමින්, ඊට අදාල බදු ගිවිසුම සකස් කර මහ සභාව ඉදිරිපත් කල යුතු බව ප්‍රකාශ කරන ලදි.

අදාල බදු ගිවිසුම සකස් කර මහ සභාවට ඉදිරිපත් කිරිමෙන් අනතුරුව ඉහත ඉල්ලිම සළකා බැලිමට අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා හා ගරු උප සභාපති ආර්.ඒ. නිලංක සඳකැල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් පෙ.ව.11.00 සිට පෙ.ව.11.30 දක්වා තේපැන් සංග්‍රහය සඳහා සභාව කල් තබන ලදි.

**vii.** සිංගක්කුලිය මැතිවරණ කොට්ඨාසයේ පිහිටි යෝගියාන ආදාහනාගාරයට යාබදව පන්නල ප්‍රධාන මාර්ගයට මුහුණ ලා ඇති බිම් කොටසෙහි උද්‍යානයක් ඉදිකිරිමට කටයුතු කරන ලෙසට යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මයා විසින් ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතා ස්ථිර කිරිමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**viii.** දංකොටුව පොලිස් ස්ථානය ප්‍රජා පොලිස් කමිටුව මඟින් ප්‍රදේශවාසී මහජනතාවට පැල බෙදා දීමේ උත්සවයේ දී බෙදා දීම සඳහා අවශ්‍ය පළතුරු පැල හා එළවලු පැල 200 ලබා ගැනීමට සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රි ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කිරිමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**ix.** 2019 වර්ෂය වෙනුවෙන් සභාවට අයත් දේපල බදුදීමේදී 2018 වර්ෂය සඳහා ඇති අවම ලංසුව පදනම් කරගෙන ටෙන්ඩර් කැඳවීමට අදාල යෝජනාව ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**x.** කලුවච්චිමුල්ල ග්‍රාම නිලධාරි වසමට අයත් ගුරුගේවත්ත නමින් හඳුන්වන ඉඩම "අරලිය උයන" ලෙස නම් කිරිමට අදාල යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතා ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**xi.** සිරිගම්පල ප්‍රේමසිරි මුතුකුඩ මාවත පෙරාඩ් මජේල්ලා සුරුවම අසලින් ආරම්භ වී වෙළ අසලින් අවසන් වන දිග මීටර් 400 ක් හා පළල මීටර් 04 ක් වන මාර්ගය " සනී වැන්ඩර්ලන් මාවත" යනුවෙන් නම් කිරිමට අදාල යෝජනාව ගරු මන්ත්‍රී කේ. නොඑල් සුදත් ජානක පෙරේරා මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී. නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා ස්ථිර කිරීමෙන් ඒකමතිකව සභා සම්මත විය.

**xii.** 2018.10.04 දින පැවති කර්මාන්ත කමිටුවේදී ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝධාභය වික්‍රමසිංහ මහතා කළ යෝජනා අනුව වාහනවලට ඉන්ධන පිරවීමේදී නිලධාරින් දෙදෙනෙකු යැවිය යුතු බවට හා ඒවාට සීල් තැබිය යුතු බවට යෝජනාව ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කිරීමෙන් ඒකමතිකව සභා සම්මත විය.

**xiii.** 2018.10.04 දින පැවති කර්මාන්ත කමිටුවෙහි ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා සහ ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝධාභය වික්‍රමසිංහ මහතා යන මන්ත්‍රීවරුන් කළ යෝජනා අනුව මෝටර් ග්‍රේඩරය සහ බැකෝ යන්ත්‍රය වෙන්නප්පුව වාහන අංගනය සඳහා කඩිනමින් යොමු කළ යුතු බවට අදාල යෝජනාව ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදි.

ගරු සභාපතිතුමා කථා කරමින්, කිරිමැටියාන වාහන අංගනය ඉදිකිරිමේ කටයුතු සුදානම් කර ඇති බැවින්, වෙන්නප්පුව වාහන අංගනය වෙත වාහන ගෙන ඒමේ අවශ්‍යතාවයක් නොමැති බව පැහැදිලි කරන ලදි.

ගරු උපසභාපතිතුමා කථා කරමින්, කිරිමැටියාන උපකාර්යාලයේ නවතා තබන වාහන සඳහා සඳහා බෝතලේගම සමුපකාර ඉන්ධන පිරවුම් හලෙන් ඉන්ධන ලබා ගැනිමට කටයුතු සැලැස්වීම සුදුසු බවට අදහස් ප්‍රකාශ කරන ලදි.

සභාව සතු ගැටලු සහගත වාහන සඳහා G.P.R.S. තාක්ෂණය භාවිතා කිරිම සුදුසු බවට ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා අදහස් ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපතිතුමා කථා කරමින්, මාර්ග,ඉඩම්,ගොඩනැගිලි කාර්මික සේවා කාරක සභාවේදී මේ පිළිබඳ සාකච්ඡා කර තීරණයක් ලබා දෙන ලෙස දන්වන ලදි.

**05.** කාරක සභා වාර්තා සළකා බැලීම

**01. 2018.09.12** දින පැවති පොදු පහසුකම් සංවර්ධන හා ආපදා කළමනාකරණ කාරක සභා වාර්තාව

ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා කථා කරමින්, කාරක සභා වාර්තාවේ සඳහන් වෙන්නප්පුව බයිසිකල් නැවැතුම්පල සතියකට බදුකුලී අඩු කිරිමට ගත් තීරණයට අදාල ඉල්ලීම් ලිපිය මහ සභාවට ඉදිරිපත් කරන ලෙසත්, මින් ඉදිරියට ඒ සම්බන්ධව ගන්නා සියලු ක්‍රියාමාර්ග පිළිබද සභාව දැනුවත් කරන ලෙසත් ඉල්ලා සිටින ලදි.

ඉදිරිපත් කර ඇති කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ගරු මන්ත්‍රිනි ජේ.කේ. දීපා මේරි අයිරංගනි පෙරේරා මහත්මිය යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කිරිමෙන් වාර්තාව සභා සම්මත විය.

**02. 2018.09.04** දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව

ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා කථා කරමින්, අතිකාල ගෙවීම සම්බන්ධ මුදල් කමිටු වාර්තාව සමඟ ඉදිරිපත් කර ඇති උපලේඛනය ප්‍රධාන කාර්යාලය හා කිරිමැටියාන කාර්යාලය පමණක් සඳහන් කර ඇති අතර, අනෙක් උපකාර්යාල දෙකෙහි නිලධාරින්/සේවකයින් අතිකාල ලබා නොගෙන්නේද යන්න විමසන ලදි. මෙම ගෙවීම සිදුවන්නේ කොපමණ කාල සීමාවකට යන්න සඳහන්ව නොමැති බවත්, මෙම අතිකාල අනුමැතිය ලබා දුන් ලිපිය ඊලඟ මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලෙසත් හා වාහන සඳහා ඉන්ධන ලබා ගැනිමට අදාල වාර්තා අනුමත කිරිම සඳහා ඉන්ධන ලබා ගැනිමේ වාර්තාව සමඟ වාහනවල දෛනික ධාවන සටහන් ඉදිරිපත් කිරිමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටින ලදි.

ඉදිරිපත් කර ඇති කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට. ගරු මන්ත්‍රී ගරු මන්ත්‍රී කේ.එල්. චමින්ද කුමාර කරුණානායක මහතා යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී ඩබ්.ඒ. රෙන්ෆ්‍රිඩ් ෂවින් ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කිරිමෙන් වාර්තාව සභා සම්මත විය.

**03. 2018.09.06** දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැගිලි කාර්මික සේවා කාරක සභා වාර්තාව

කාරක සභාවේදී සාකච්ඡා කල කරුණු කිහිපයක් පිළිබඳව මාර්ග,ඉඩම්,ගොඩනැගිලි කාර්මික සේවා කාරක සභා සභාපති ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා මහ සභාව දැනුවත් කරන ලදි.

ගාල් කරන වාහනවල යතුරු නිශ්චිත ස්ථානයක තබනවාද යන්න විමසන ලද අතර, ගරු සභාපතිතුමා කථා කරමින්, කිරිමැටියාන උපකාර්යාල භූමියේ නවතා තබන වාහන සඳහා එම කාර්යාලයේ නිශ්චිත ස්ථානයක ප්‍රධාන කාර්යාල නවතා තබන විට ප්‍රධාන කාර්යාලයේ නිශ්චිත ස්ථානයක වෙන් කර ඇති බව ප්‍රකාශ කරන ලදි. ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා ආදාහනාගාරවල යතුරු සඳහා නිශ්චිත ස්ථානයක වෙන් කර ඇති ද යන්න ගරු සභාපතිතුමාගෙන් විමසන ලදි.

ආදාහනාගාරයේ වැඩ නිම වි යතුරු භාර දිමට අවශ්‍යතාවය පවතින නමුත් එම වේලාවේදී කාර්යාලයේ යතුර භාර ගැනිමට සිටින්නේ මුරකරුවකු පමණක් බැවින් එහි ගැටලු සහගත තත්වයක් මතු වි ඇති බව ගරු සභාපතිතුමා පැහැදිලි කරන ලදි.

ආදාහනාගාරය තුළ විවිධ අයථා ක්‍රියා සිදුවන බැවින්, යතුර පොලිසිය වෙත භාර දීම හා ආදාහනාගාරය සඳහා CCTV කැමරා පද්ධතිය සඳහන් කරන ලෙස ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා ඉල්ලා සිටින ලද අතර, ආදාහානාගාර දෙක සඳහා CCTV කැමරා පද්ධති සවිකරන ලෙස ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ද ඉල්ලා සිටින ලදි. ගරු සභාපතිතුමා කථා කරමින්, ඒ සඳහා කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා කථා කරමින්, වෙන්නප්පුව නගරයට ආදර්ශ බස් නැවැතුම් ස්ථාන ඉදිකිරීමට කාරක සභාව විසින් ගන්නා ලද තීරණය පිළිබඳ පැහැදිලි කරන ලදි. මුලින්ම තෝප්පුව මංසන්ධියෙන් ආරම්භ කරන බව දන්වා සිටින ලදි. ගරු සභාපතිතුමා කථා කරමින් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට ඇතුල්වන ස්ථානය වන තෝප්පුව මංසන්දිය අලංකාර ලෙස සකස් කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කරන ලදි.

සිරිගම්පල උදාසිරිගම ක්‍රීඩා පිටිය අක්කර 06 ක ඉඩම වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට ලබා ගැනීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය සහ එම කටයුතු කඩිනම් කිරීමට කටයුතු කරන ලෙසට ඉල්ලා සිටිමින් එහි වර්තමාන තත්වය පිළිබදව ගරු මන්ත්‍රී එම්.එම්. ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා සභාව දැනුවත් කරන ලදි.

ඇල්බට් ඇෆ් පිරිස් ක්‍රීඩාංගනයට ඉඩම කොටසක් ලබා ගැනීමට අදාළව ඉඩම් හිමිකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපිය හා ප්‍රාදේශීය ලේකම් වෙන්නප්පුව විසින් ඉදිරිපත් කර ඇති ප්‍රමිතිකරණය කරමින් පවතින භූගෝලීය නාමාවලියේ නිරවද්‍යතාවය සනාථ කරගැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ අදහස් විමසා ඇති ලිපිය සභාවට ඉදිරිපත් කර ඇති බව ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදි.

මාර්ග,ඉඩම්,ගොඩනැගිලි කාර්මික සේවා කාරක සභාවට ඉදිරිපත් කර ඇති ලේඛනවල පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ලෙස සඳහන් කිරිමැටියාන වී.සී. මාවතේ අයිතිය සභාව සතු බවත් එහි කෙලවර කොටස පළාත් සභාවට අයත් බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කළ අතර, හාල්දඩුවන තම්බිවත්ත පාර පළාත් සභාවට අයත් මාර්ගයක් වුවත් එම මාර්ගය ඉදිරිපත් කර ඇති ලේඛනයේ සඳහන් වී නොමැති බවත්, පළාත් සභා මාර්ග හා ප්‍රාදේශීය සභා මාර්ග තෝරා ගෙන අදාල නඩත්තුව යොමු කළ යුතු බවත් පැහැදිලි කරන ලදි.

ඉදිරිපත් කර ඇති කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී යූ. ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

**04. 2018.09.20 දින පැවති සංවර්ධන උපදේශන කාරක සභා වාර්තාව**

ඉදිරිපත් කර ඇති කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට. ගරු මන්ත්‍රිනි ආර්. නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී ජී.කේ. අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

**05. 2018.09.26 දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව**

ගරු මන්ත්‍රී ඩී. නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා කථා කරමින්, ගිංඔය රක්ෂිතය හා ගිංඔය පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සියලු දෙනා එක්ව බැඳී සිටිය යුතු බවත් ඒ සඳහා විශේෂ වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ගරු සභාපති තුමා වෙතින් ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා කථා කරමින් වෙන්නප්පුව ප්‍රදේශයේ පරිසර ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ මතය විමසනවාද?පරිසරය සම්බන්ධ කටයුතු වලදි ප්‍රාදේශීය සභාවේ නිර්දේශය ලබා ගන්නේද?නිසි ක්‍රමවේදය ඉටු වන්නේද යන්න ප්‍රශ්න කරමින් ලද අතර පළාත් පාලන ආයතන වල නීති රීති මධ්‍යම ආණ්ඩුව නොපිළිගැනීමේ ගැටළු සහගත තත්වය පැහැදිලි කරන ලදී.

ගරු සභාපති තුමා කතා කරමින් මේ සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් පැනවිය හැකි බැවින් ඒ සඳහා කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා අදහස් ප්‍රකාශ කරන ලදී.

ඉහත කාරණා සියල්ල සමඟම 2018.09.26 දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී එල්.කේ .ජගත් ප්‍රියංකර මහතා යෝජනා කල අතර ගරු මන්ත්‍රී ඒ. රෙක්සි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා ස්ථිර කිරීමෙන් සභා සම්මත විය.

**06. ලැබීම් හා වියදම් පිළිබද මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබද ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරිමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සළකා බැලිම.**

01. මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශ - 2018 අගොස්තු
02. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශ - 2018 අගොස්තු

ඉහත වාර්තා සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී යු. ජුඩ් එම්මානුවෙල් මහතා විසින් ස්ථිර කිරිමෙන් වාර්තා සභා සම්මත විය.

**07. වෙනත් කරුණු හා අදහස් ඉදිරිපත් කිරිම**

ඉන්ධන මිල වැඩිකිරිම සඳහා වන නව ක්‍රමය හා අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ දැමීම පිළිබඳව ගරු මන්ත්‍රී එම්.පි.ඩී. උදේශ් තරංග කරුණාරත්න මහතාගේ අදහස් දැක්විම.

දිනෙන් දින ඉන්ධන මිල ඉහළ යාම දැවැන්ත ප්‍රශ්නයක් බවට පත් වී ඇති බවත් සූත්‍රයක් පිළිබඳ කතා කලද එහෙත් අගමැතිතුමා හෝ මුදල් ඇමතිතුමා සූත්‍රයක් ගැන නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදී. ආණඩුව පවසන ආකාරයට ඩොලරය ස්ථාවර වී බොර තෙල් මිල ගණන් මිල ඉහළ ගොස් ඇතැයි කියන කාරණය බොරුවක් බවත් ලෝක බොර තෙල් මිල පහළ වැටුනු මොහොතක තෙල් මිල ඉහළ යාමට කිසිදු හේතුවක් නොමැති බවත් මෙය ව්‍යාජ සූත්‍රයක් බවත් පැහැදිලි කරන ලදී. සිංගප්පූරු ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුම යන්නෙහි නියම අර්ථය ලෝක වෙළඳ සංවිධානයත් ශ්‍රී ලංකාවත් අතර ගිවිසුම ලෙස විය යුතු බව එතුමාගේ අදහස බව ප්‍රකාශ කරන ලද අතර මෙම ගිවිසුම කර්මාන්ත කරුවන්ට, ව්‍යාපාරිකයන්ට, නීතිවේදීන්ට, සංචාරක ව්‍යාපාරිකයින්ට, රැකියා වෙළඳපොලට කෙසේ බලපාන්නේද යන්න පිලිබඳව පැහැදිලි කරමින් අදහස් ප්‍රකාශ කරන ලදී.

නැගෙනහිර නයිනමඩම පිංචත්ත ඉඩම පිළිබඳ වාර්තාවක් මහා සභාවේදී ඉල්ලා සිටි අතර එම තොරතුරු ලැබී නොමැති බැවින් ගරු මන්ත්‍රී එම්.පි.ඩී. උදේෂ් තරංග කරුණාරත්න මහතාජ් පිළිබඳ විමසන ලදී.

ගරු සභාපති තුමා කතා කරමින් මෙය එතුමාගේ පාලන කාලය තුල සිදු වූ දෙයක් නොවන බවත් තොරතුරු සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී. නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා කථා කරමින්, ලබන සතිය වන විට පුත්තලම් දිස්ත්‍රික්කයේ සියලුම පොලිස් ස්ථාන ආවරණය වන පරිදි සෑම පොලිස් ස්ථානයකටම සුව සැරිය ගිලන් රථය බැගින් ලැබෙන බව ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම සිංගප්පූරු වෙළඳ ගිවිසුම අපේ රට ජාත්‍යන්තර සමඟ සම්බන්ධ වී ඉදිරියට යන වැඩපිළිවෙලක් ගොඩනැගීමට හැකිවන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා කථා කරමින්, ආර්ථිකය කඩා වැටුනේ ඇයි? විසඳගැනීමට බැරි ගණිත සූත්‍ර ගෙනාවේ ඇයි? යන කාරණය ප්‍රමාද වී හෝ පිළිගැනීම පිළිබඳව සතුටු වන බව ප්‍රකාශ කරන ලදී. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් බලහත්කාරයෙන් ජනතාව වෙත ගෙන ඒමට කටයුතු කරමින් පවතින බවත් එය වහාම ඉවත් කර ගැනීම ඵලදායී බවත් යහපාලනය අසාර්ථක බව පෙනී යන බවත් ප්‍රකාශ කරන ලදී.

කිරි පැකට් වල රස පරීක්ෂක වාර්ථාව පිළිබඳව ගරු සභාපති තුමාගෙන් විමසන ලද අතර කඩිනමින් එම වාර්තාව ලබා දෙන බව ගරු සභාපති තුමා ප්‍රකාශ කරන ලදි.

ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා කථා කරමින් 2018.09.05 වන දින පැවති විරෝධතාවයේදී කිරිපැකට් සම්බන්ධව ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා කල පැමිණිල්ලට අදාළව ලද රස පරීක්ෂක වාර්තාවට අනුව එහි සයනයිඩ්, ලෝහමය වස ,පළිබෝධනාශක හෝ ඖෂධ වර්ගයක් ඇතුලත් නොවන බව සඳහන් කරමින් පොලිස් මාධ්‍ය ප්‍රකාශක විසින් කළ ප්‍රකාශය අනුව 2018.10.05 දින ලංකාදීප පුවත්පතේ පළ කර ඇති ලිපිය කියවන ලදී.එම ප්‍රකාශය අසත්‍ය නම් ඒ පිළිබඳව නීතිමය පියවර ගන්නා ලෙසත් එම තීන්දුව අභියෝගයට ලක් කල හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා කථා කරමින්, වසර දෙකක පමණ පෙර රස පරීක්ෂක වාර්තා තවමත් ලබා ගැනීමට නොහැකි වී තිබීමත් මාසයක කාලයක් තුල මෙම වාර්තාව ලබා දීමට තිබුණු හදිසිය පිළිබඳවත් අදහස් ප්‍රකාශ කරන ලදී. මීට අදාළ නඩුව තවමත් අධිකරණයේ විභාග වෙමින් පවතින බවත් එහි අධිකරණ තීන්දුව ඉදිරියේදී ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා කථා කරමින්, සමිති මගින් කොන්ත්‍රාත් සඳහා ගිවිසුම් අත්සන් කිරීමේදී ප්‍රා දේශීය ලේකම් මගින් අනුමත සමිතියක් සඳහා නිර්දේශ ලබාගැනිමේ අවශ්‍යතාවයන් නොමැති බවට අදහස් දක්වන ලදි.

ගරු සභාපතිතුමා කථා කරමින් ප්‍රාදේශීය සභා යටතේ ප්‍රජා මණ්ඩල පිහිටුවා ගත හැකි බැවින්, සෑම කොට්ඨාසයකම ප්‍රජා මණ්ඩල විධිමත්ව පිහිටුවා ගන්නා ලෙසත් දන්වන ලදි.
ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා කථා කරමින්, PF-7444 අංක දරණ කැබ් රථයේ දෛනික ධාවන සටහන් පත්‍ර සභා ගත කරන ලෙස ඉල්ලීමක් කළ බවත්, තවමත් එම ධාවන සටහන් නොලැබුණු බවත්, එම වාර්තා ලබාදෙනවාද? නැද්ද? යන්න විමසන ලදි.

කල්දී ඇති ප්‍රශ්න යටතේ මේ පිළිබඳ පිළිතුරු ලබා දී ඇති බැවින්, නැවතත් මේ පිළිබද කථා කිරිමේ අවශ්‍යතාවයක් නොමැති බව ගරු සභාපතිතුමා දන්වා සිටින ලදි.

නැවතත් ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා කථා කරමින්, 2018.10.03 වන දින ඇල්බට් ඇෆ් පිරිස් ක්‍රිඩාංගනයේ පැවති උත්සවයකදී පුද්ගලයින් බීමත්ව අශෝබන ලෙස හැසිරිම හා නොගැළපෙන කථා විලාසය හේතුවෙන් ජනතාව අපහුසතාවයට පත් විමේ සිදුවිම සම්බන්ධයෙන් ගත් පියවර විමසන ලදි.

ඒ පිළිබද සොයා බලා කටයුතු කරන බව ගරු සභාපතිතුමා දන්වා සිටින ලදි.

පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් බොරලැස්ස කිරාගාර මාර්ගයේ ඉදිකරන ලද තාප්පය සඳහා පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලද නිර්දේශය සභාවට ඉදිරිපත් කරන ලෙසට ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා ඉල්ලා සිටින ලදි.

මාධ්‍යවේදීන් සඳහා මේසයක් ලබාදෙන ලෙසට ගරු මන්ත්‍රී ඩබ්.ඒ. ගෝඨාභය වික්‍රමසිංහ මහතා ඉල්ලා සිටින ලදි.

ගරු මන්ත්‍රී බි. ඇන්ටනි සුනිල් ශාන්ත පෙරේරා මහතා කථා කරමින්, වෙන්නප්පුව වෙළද සංකිර්ණයේ බදුකරුවන් ගේ නාම ලේඛණය සකස් කර ලබා දිම පිළිබඳව ලේකම්තුමාට ස්තුතිය පළ කරන ලදි. සභා අරමුදල් වලින් ආධාර ලබා ගන්නා ලද ප්‍රතිලාභින්ගේ නාම ලේඛනයක් මන්ත්‍රීවරුන් වෙත ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි.

සභාවේ මංගල රැස්විමේ දී ගන්නා ලද සමුහ ඡායාරූපය පිළිබඳව ගරු මන්ත්‍රී ඩි. නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා විමසන ලද අතර, ගරු සභාපතිතුමා කථා කරමින් එම ඡායාරූපය රාමු කිරිම සඳහා භාර දි ඇති බවත්, පිටපත් අවශ්‍ය වන්නේ නම් ඡායාරූප ශාලාවෙන් ලබා ගත හැකි බවත්, පැහැදිලි කරන ලදි.

සියලු දෙනාටම ස්තුතිය පළ කරමින් ප.ව 2.00 ට පමණ සභාවේ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.

කේ.වි. සුසන්ත පෙරේරා
සභාපති
වෙන්නප්පුව ප්‍රාදේශිය සභාව